මානුෂීය සේවායතන සමූහය

ජූනි 2010

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

CONSORTIUM OF HUMANITARIAN AGENCIES (GTE) LIMITED

ISO 9001 REGISTERED

## ජාතික විශ්ලේෂණය


| | |
|---|---|
| දේශපාලන සංදර්භය | 2 |
| පාලනය | 2 |
| මානව හිමිකම් | 3 |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | 4 |
| ආර්ථික සංධර්භය | 4 |
| මානුෂීය සහ සංවර්ධන අවකාශය | 5 |
| පරිසරය | 6 |

**පළාත් විශ්ලේෂණ**

**නැගෙනහිර පළාත**

| | |
|---|---|
| අම්පාර | 7 |
| මඩකලපුව | 7 |
| ත්‍රිකුණාමලය | 7 |

**උතුරු පළාත**

| | |
|---|---|
| යාපනය | 7 |
| මන්නාරම | 8 |
| වව්නියාව | 8 |

**බස්නාහිර පළාත**

| | |
|---|---|
| කොළඹ | 8 |


## ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | → |
| පාලනය | ↓ |
| මානව හිමිකම් | ↓ |
| සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය | → |
| ආර්ථික සංධර්භය | → |
| මානුෂීය සහ සංවර්ධන අවකාශය | → |
| පරිසරය | ↘ |
| | |

දර්ශකය

## සාරාංශය

මෙම මාසයේ දේශපාලනික වශයෙන් ගත්කල දක-න්නට ලැබුණු වැදගත්ම සිදුවීම වූයේ විශේෂයෙන්ම පසුගිය වසරේ නිමාවට පත්වුණු යුද්ධයේ අවසාන භාගයේදී සිදුවූයේ යැයි පැවසෙන යුධ අපරාධ සම්බන්ධයෙන් වූ මානව හිමිකම් උල්ලංගනය කිරීම පිළිබඳව සොයාබලන ලෙස අන්තර්ජාතික ප්‍රජාවෙන් ශ්‍රී ලංකාවට එල්ල වූ බලපෑම්ය. එක්සත් ජාතීන්ගේ මහලේකම්තුමා මේ සම්බන්ධයෙන් උපදෙස් දීමට උපදේශක කමිටුවක් පත්කලේය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය උසස් නිලධාරීන් පිරිසක් මේ පිළිබඳව සාකච්ඡා පැවැත්වීම සඳහා කොළඹට එවනු ලැබිණි. මේ අතර ශ්‍රී ලංකාවේ විදේශ ඇමතිවරයා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරික කටයුතු වලට ඇගිලි ගැසීමක් ලෙස සලකා මෙම අන්තර්ජාතික මැදිහත් වීම පිළිබඳව තමන්ගේ දැඩි විරෝධය පළ කිරීම සඳහා එක්සත්ජාතීන් සහ එක්සත් ජනපද නිලධාරීන් හමුවිය. මෙයට විකල්පයක් ලෙසින් ජනාධිපති මහින්ද රාජපක්ෂ "අතීතයෙන් පාඩම් ඉගෙන ගැනීම සහ ප්‍රතිසංධානය පිළිබඳ" කමිටුවක් පත්කිරීමට කටයුතු කල අතර මෙමගින් අන්තර්ජාතික ප්‍රජාව සෑහිමකට පත්වේ යැයි බලාපොරොත්තු විය.

එක්සත් ජාතීන් විසින් පත්කළ මෙම මෙම ත්‍රි පුද්ගල උපදේශක කමිටුව පත්කිරීම හෙළාදකිමින් රාජ්‍ය මාධ්‍ය මගිනි පුවත් පලකලේය. මේ අතර සමහර පෞද්ගලික මාධ්‍යයද මෙ-වැනිම ප්‍රතිපත්තියක් අනුගමනය කලෝය.

දේශීය දේශපාලන ප්‍රවෘත්ති අතරින් මුල් තැනක් ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ අනාගතය මෙහෙයවීම සඳහා වූ නායකත්වය තේරීම සම්බන්ධයෙනි. මහජනයාගේ අදහස් නිසි විමසීමකට ලක්නොකර රජය විසින් කඩිමුඩියේ ව්‍යවස්ථා සංශෙ-ා්ධනයක් ගෙන ඒම සඳහා උත්සාහ කිරීම සමහර පාර්ශවයන් විසින් අවධානයට ගෙන තිබිණි. මේ පිළිබඳව අදහස් දැක්වූවන් අතර නිතිඥ සංගමය, වෘත්තීයවේදීන්ගේ සංසදය, රාවය පුවත් පතේ තීරු ලිපි සම්පාදකයෙක් සහ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ නිතිඥයෙක්ද විය

යහපාලනය සහ මානව හිමිකම් උල්ලංගනය පිළිබඳ කරුණු පශ්චාත් යුධ සමයේ රජය විසින් ආරම්භ කරන ලද සංවර්ධන වැඩකටයුතු වලට බාධාවක් වී ඇත. යුරෝපීය සංගමය විසින් මානව හිමිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනුගම-නය කළයුතු කොන්දෙසි ගණනාවක් සඳහන් කර ශ්‍රී ලංකාවට GSP+ සහනයක් ලබාදීමට නම් රජය මීට අනුව කටයුතු කළයුතු යැයි දන්වා සිටියේය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජය මෙම කොන්දේසි වලට එකගවීම තරයේ ප්‍රතික්ෂේප කලේය.

ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම අලෙවි වන සිංහල සතිඅන්ත පුවත්පතවූ ශ්‍රී ලංකාදීප පුවත් පතේ යුරෝපීය සංගමය තම GSP+ සහන-යක් ලබාදීම තවදුරටත් හයමසක් සඳහා දීර්ඝ කර ඇත යනුවෙන් වැරදි පුවතක් පළ කළේය. මෙවැනි පුවත් පළ කිරීම මගින් දේශිය මුද්‍රිත මාධ්‍යයේ විශ්වශනීය භාවය සම්බන්ධයෙන් ප්‍රශ්න පැනනැගේ.

රජය 2010 වසර සඳහා වූ තම අයවැයෙන් රුපියල් බිලියන 202 ක එනම් පසුගිය වසරට වඩා බිලියන 24 ක් 13.5% ආරක්ෂාව සඳහා වෙන් කිරීමෙන් රජයේ පුමුඛ අවධානය ආරක්ෂාව බව පැහැදිලි වේ. මෙ පිළිබඳව විවේචනය කරන්නන් පවසන්නේ රජය ප්‍රතිසංධානයකත් සාම ගොඩනැංවීමත් කෙරෙහි මෙමෙ අයවැය කරුනු වලදී මුල් තැනක් ලබාදිය යුතු බවය. මෙහිදී යුධ සූදානම අවම කර සමාජ සුභසාධනය, අවතැන්වූවන් සඳහා පුනරුත්ථාපන කටයුතු, සහ ආර්ථික සංවර්ධනයට වැඩි මුදලක් වෙන් කළ යුතුවේ.

මූල්‍ය අරමුදලට පිළිගත හැකි ආකාරයට අයවැය පරතරය තබාගත යුතු හෙයින් මෙවර අයවැයේ රජයේ අතිරේක වියදම් සීමාකර තිබේ. මූල්‍ය අරමුදල විසින් ලබාදෙන ලද ණය මුදලේ තෙවන කොටස නිකුත් කර තිබුණු අතර දැනට පවත්නා 9% අයවැය පරතරය 2010 වසරේ දී වඩා ස්ථාවර අගයට 2010 වසරේ දී පත්කිරීමට කටයුතු කරනු ඇතැයි මූල්‍ය අරමුදල අපේක්ෂා කරයි.

මෑතදී සිදුවුනු සිදුවීම් ගණනාවක් නිසා රටේ අවධානය ළමා අයිතිවාසිකම් පිළිබඳව යොමුවිනි. මෙහිදී දක්නට ලැබෙන කණගාටුදායක තත්වයක් රටේ ළමා ශ්‍රමිකයන් සම්බන්ධයෙන් පවත්නා තත්වයයි. එසේම උතුරු නැගෙනහිර ජීවත්වන දරුවන්ගෙන් 46% මන්දපෝෂණයෙන් පෙළෙන බව සෞඛ්‍යය අමාත්‍යාංශය කළ සමීක්ෂණයකින් හෙළිවිය. දකුණේ ග්‍රාමීය ප්‍රදේශ වලින්ද වතුකරයෙන්ද මෙම තත්වයම වාර්තා විය. මේ අතර LTTE ළමා සොල්දාදුවන් සාර්තක අන්දමින් පුනරුත්ථාපනය කිරීමට හැකිවීම ධනාත්මක ලක්ෂණ -යක් ලෙස හැදින්විය හැකිය.

මෙම මාසය අගවන විට වන්නි-යේ රැදී සිටින අවතැන්වූවන්ගේ සංඛ්‍යාව 50000 දක්වා අඩු විය. නැගෙනහිර ප්‍රදේශයේ අවතැන් වූවන්ගෙන් 42000 ක් දරුවන් සිටින වැන්දඹුවන් වේ. මීලග මාස දෙක ඇතුළතදී ඉතිරිවී සිටින අවතැන්වූවන් 50000 නැවත පදිංචි කරන ලෙස ජනාධිපතිතුමා විසින් නියෝග කර ඇත. මේ අතර අවතැන් වූවන් සඳහා නිවාස සෑදීම සඳහා සහනදායී පදනමින් ණය සැපයීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නගා තිබේ.

මෙම මසයේදී බන්ධනාගාර ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් වාර්තා විණි. මෙහිදී රජය විසින් සුලු වැරදි සඳහා සිරගත වූවන්සේම නියම වූ දඩය ගෙවාගත නොහැකිවි සිරගෙවල් වල සිටින පුද්ගලයින් නිදහස් කිරීම සඳහා විධිවිධාන සලසනු ඇත. මෙහි මූලික අරමුණ වන්නේ බන්ධනාගාරවල පවතින තදබදය අඩු කිරීමත් මේ සඳහා රජය දරණ පිරිවැය අවම කිරීමත්ය.

පොලීසිය දෙමළ ජාතික තරුණ තරුණියන් 269 දෙනෙක් උතුරු ප්‍රදේශයේ සේවයේ යෙදවීම සඳහා බඳවා ගැනීමට කටයුතු කලේය. මෙය ප්‍රතිසංධාන ක්‍රියාවලිවේදී ඉතා වැදගත් පියවරක් වනු ඇත.

පරිසරය සම්බන්ධයෙන් ගත් කළ නිරිත දිග මෝසමේ බලපෑම හේතු කොටගෙන දිවයිනේ දකුණු සහ බස්නාහිර ඇතුලුව බොහෝ පදේශ වල ගංවතුර තත්වයන් ඇති විය. මෙයට සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ ලෙස අම්පාර දිස්ත්‍රික්කයේ දැඩි නියගයක් පවතින අතර සමහර ප්‍රදේශ වල බීමට ජලය සොයාගැනීමේ ගැටලුවක් පැනනැගී ඇත. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිසි සැලසුමක් නොමැති හෙයින්

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනසක් නැත | → | මඳ ප්‍රගතියක් පෙන්වයි | ↗ | මඳ පිරිහීමක් පෙන්වයි | ↘ |
| සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි | ↑ | සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි | ↓ | | |

නැවත වතාවක් මෙම අපද්‍රව්‍ය, කැළිකසල කොළඹ නගරයේ කානු පද්ධතීන්ට මුදාහරින අයුරු නාගරික ප්‍රදේශ සමහරක දක්නට ලැබේ. ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය දක්වන අන්දමට වැඩිහිටියන් රැසක් තමන්ට තමන්ව නඩත්තු කරගැනීමට නොහැකි බවට සඳහන් පැමිණිලි රාශියක් ලැබෙන බව වාර්තා කළේය. මේ අයට ප්‍රමාණවත් ලෙස ආහාර හෝ නිසි රැකවරණ නොලැබේ. මෙය ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහණය මීලග දශක දෙකෙද්දී සීඝ්‍රයෙන් ඉහළ යාමත් ඒ සම්බන්ධයෙන් ඇතිවිය හැකි ගැටලු කාරී තත්වයන් පිළිබඳව පෙර අනතුරු හැගවීමක් ලෙස හැඳින්විය හැකිය .

# ජාතික විශ්ලේෂණය

## දේශපාලන සංදර්භය

ජූනි මාසය දේශපාලනික වශයෙන් වැදගත් සිදුවීම් ගණනාවකින් යුක්තවූ අතර මෙයින් සමහරක් ඒවා ශ්‍රී ලංකාවේ අනාගතය සම්බන්ධයෙන්ද ඉතා වැදගත්වේ. රජය මෙම වසර සඳහා වූ අයවැය ලේඛනය ඉදිරිපත් කරන ලද අතර මෙහෙදී සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ආරක්ෂක වියදම් සඳහා වෙන්කර තිබුණි. එසේම පුනරුත්ථාපන වැඩසටහන් සඳහා ප්‍රමාණවත් අයුරින් මුදල් වෙන්කර නොතිබිනි. මිලගට අවධානයට ලක්වූ කරුණු වූයේ එක්සත් ජාතික පක්ෂයේ කඩා වැටීම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් ගේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපත් බැරක් ඔබාමාගේ නියෝජිතයින් හමුවීමය.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ බහුපාර්ශවීය සබඳතා පිළිබඳ විශේෂ සහායක වශයෙන් කටයුතු කරන සමන්තා පවර් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් පත්කරන ලද හිටපු අග්‍ර විනිශ්චයකාර C R ද සිල්වාගේ නායකත්වයෙන් යුත් ප්‍රතිසංධානය පිළිබඳ කොමිසම හමුවිණි. මෙයට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දේශපාලන කටයුතු පිළිබඳ නියෝජිතයකු වන ලියන් පැස්කෝ මහතාද මෙම කමිටුව හමුවිණි.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කටයුතු පිළිබඳව තමාට උපදෙස් ලබාදීම සඳහා ත්‍රි පුද්ගල උපදේශක කමිටුවක් මහලේකම් බැන්කි මූන් විසින් පත්කරන ලදී. මෙහි නායකත්වය දරන්නේ ඉන්දුනීසියාවේ හිටපු නීතිපති ජෙනරාල් මර්සුකි දරුස්මන් විසිනි.

මෙහි අනෙකුත් සාමාජිකයින් වන්නේ ඇමෙරිකානු නීතිඥයකු වන ස්ටීවන් රැට්නර් සහ දකුණු අප්‍රිකානු ප්‍රතිසංධාන කොමිසමේ සාමාජිකයකු වූ යස්මින් සූකාය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට අමුත්තකු නොවන ජපානයේ විශේෂ නියෝජිත යසුෂි අකාෂි කොළඹදී වාර්තාකරුවන්ට පැවසුයේ එක්සත් ජාතීන්ගේ කමිටුව ශ්‍රී ලංකාවේ කටයුතු සඳහා මැදිහත්වියයුතු නැති බවත් ශ්‍රී ලංකා රජය සමග සාකච්ඡා කර උපදෙස් සහ යෝජනා ඉදිරිපත් කිරීම පමණක් සිදුකල යුතු බවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් සහ ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශයට අනුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරුකීමට ගනු ලබන විධිවිධාන ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් අන්තර්ජාතික මානව හිමිකම් කණ්ඩායමක් විසින් අධ්‍යයනය කරනු ඇත. ශ්‍රී ලංකාවේ දිගුකාලීන සාමය සඳහා වගවීමේ ඇති වැදගත්කම සම්බන්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානය අවධාරණය කරන කල්හි ඉන්දියාව වඩාත් අවධාරණය කරන්නේ ඒ සඳහා වූ දේශපාලනික විසඳුමයි. පරිණාමන තත්වයකට මුහුණ දී සිටින එක්සත් ජාතික පක්ෂය ඔවුන්ගේ නායකයා තොරාගැනීම සඳහා ඡන්ද විමසීමක් අගෝස්තු මාසයේ පවත් වනු ඇත. කෙසේ වෙතත් විරුද්ධ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ පවසන්නේ දැන් එක්සත් ජාතික පක්ෂය සර්කස් පෙන්වීම නවත්වා රාජපක්ෂගේ ඒකාධිපති පාලනයට විරුද්ධව සටන් වැදිය යුතු බවයි.

## පාලනය

***යුද්ද වියදම් මගින් සාම කාලයේ ප්‍රමුඛතා පිළිඹිබු වන්නේ නැත***

වසරකට පෙර යුද්ධය අවසන් කිරීමෙන් පසුව රජය තමන්ගේ යුධ වියදම් කපාහරිනු ඇතැයි බලාපෙරෝත්තුවක් පැවැතිණි. හදිසි නීතිය අවසන් කිරීම සහ යුධ වියදම් සඳහා වූ ප්‍රතිපාදන අඩු කිරීමේ හැකියාවක් පැවැතිනි. එසේ නමුත් යුද්ධය අවසන් කිරීමෙන් පසුව ඉදිරිපත් කරන ලද පළමුවැනි අයවැය ලේඛනය රජයේ යුධ ක්‍රියාමාර්ගයට ඉතා පක්ෂව සහයෝගය දැක්වූ කන්ඩායම් වල පවා මතභේදයට හේතුවී ඇත. යුද්ධය පැවැති සමයේදී ආරක්ෂාව වෙනුවෙන් අධික වියදමක් දැරීම LTTE සංවිධානය යුද්මය වශයෙන් පරාජය කිරීම සඳහා තම පාර්ශවය ශක්තිමත් කළ යුතුයි යන්න ගෙනහැර දක්වමින් සාධාරණය කිරීමට රජයට හැකියාව තිබිණි .

අනෙක් අතට මේ අන්දමින් යුද්ධය නිමා වීමෙන් පසුව අයවැය ලේඛනයෙන් ආරක්ෂක වියදම් සඳහා වැඩි මුදලක් වෙන්කිරීම මගින් මෙම සාම කාලයේ දැඩි අවධානයක් දැක්විය යුතු ප්‍රතිසංධානය හා පුනරුත්ථාපන කටයුතු වලට පිළිබඳ අවශ්‍යතා පිළිඹිබු නොකරයි. රජය තම අයවැය යෝජනා මගින් මෙවර ආරක්ෂක වියදම් සඳහා වූ ප්‍රතිපාදන රුපියල් බිලියන 202 දක්වා වාර්තාගත අන්දමින් වැඩි කර ඇත. මෙම මුදල පසුගිය අයවැයෙන් වෙන්කළ මුදලට වඩා බිලියන 26 ක වැඩිවීමකි. මෙම වැඩි කිරීමේ අති විශාලත්වය මැනැවින් විදහා දැක්වෙන්නේ රජය අධ්‍යාපනය සඳහා වෙන් කර ඇත්තේ රුපියල් බිලියන 27 ක් පමණක් වීමයි. එසේම රජය උසස් අධ්‍යාපනය වෙනුවෙන් වෙන්කර ඇත්තේ රුපියල් බිලියන 20 ක් පමණකි .ආරක්ෂක වියදම් මේ සා විශාලවන්නේ සාමාන්‍ය ජනතාවගේ සමාජ සුභසාධනය හා සෘජුවම සම්බන්ධ වන රජයේ අනෙකුත් අමාත්‍යාංශ ද මෙම යටතට ගැනෙන නිසයි.

සෞඛ්‍යය සඳහා වෙන් කර ඇති මුදල රුපියල් බිලියන පහකින් අඩුකර ඇති අතර දැන් මෙම ප්‍රමාණය රුපියල් බිලියන 53 කි. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුදල රුපියල් බිලියන 3 ක් පමණි. රජයේ ආරක්ෂක වියදම් සම්බන්ධයෙන් මෙවැනි විශාල මුදලක් වෙන් කිරීම රටේ ආරක්ෂාව පමණක් මුල් කරගෙන ඇති බව පෙනීයයි. අනෙකුත් අමාත්‍යාංශ සහ ආරක්ෂක අමාත්‍යාංශය අතර මෙතරම් පරතරයක් පැවැතීම පිලිබඳව රජයේ ප්‍රකාශකයා කරුණු දක්වමින් ප්‍රකාශ කලේ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් දිගින් දිගට ම අවධානය යොමු කිරීමේ ඉතා වැදගත් බවයි. ඔවුන් මෙහිදී පැවසූයේ යුද්ධය පැවැති උතුරු නැගෙනහිර ප්‍රදේශ වල අලුතින් පොලිසි ස්ථාන සහ ආරක්ෂක කපොලු පිහිටු වීමට රජය කටයුතු කරන බවය.

මෙම තත්වයට වන සූදානම මෙම ප්‍රදේශ වල සිදුකරන මාර්ග සංවර්ධන කටයුතු වලින් පැහැදිලි වේ. මෙහිදී සත්‍ය තත්වය වන්නේ යුද්ධය අවසාන වී අවුරුද්දක් ගත වී ඇතත් ශ්‍රී ලංකාව සෞඛ්‍යය, අධ්‍යාපනය, නැවත පදිංචි කිරීම යනාදී අත්‍යාවශ්‍ය සියලුම කරුණු සම්බන්ධයෙන් ආරක්ෂාව සඳහා වෙන් කර ඇති මුදලින් අඩක් පමණක් වියදම් කිරීම විශාල ගැටලුවකි. සැවොම විශ්වාස කරන පරිදි සාමය සැබෑවටම පැමිණ ඇත්නම් වැඩි වශයෙන් මුදල් වෙන්කළ යුත්තේ ආර්ථික සහ මානුෂිය සංවර්ධනය වෙනුවෙන් මිස නැවත යුධ හමුදාව ශක්තිමත් කිරීමට නොවේ. ත්‍රස්ත්‍රවාදයෙන් නිදහස් වීම තුලින් ලැබෙන වරප්‍රසාද අගය කරන්නා සේම රටේ බහුතර ජනතාව මෙම ඇතිවූ සාමකාමී තත්වය තුල ආර්ථික සහ සමාජමය ප්‍රතිලාභයන් තමන්ට භුක්ති විදීමට හැකිවේ යැයි බලාපෙරොත්තු වෙති. මෙම ජනතා බලාපෙරොත්තු ඉටු කිරීමට රජය කටයුතු නොකරයි නම් ඔවුන්ගේ බලාපෙරොත්තු බිඳවැටීම හේතු කොටගෙන රජය ඔවුන් අතර අප්‍රසාදයට පත්වීමට ඉඩ ඇත.

# මානව හිමිකම්

## මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්න

මෙම මාසයේ දී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ කරුණු අන්තර් ජාතික වශයෙන් අවධානයට ලක්විය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිලිබඳ කමිටුම නැවත වතාවක් තම අවධානය යුද්ධය පැවැති සමයේ සිදුවූ මානව හිමිකම් උල්ලංගනය කිරීම් පිළිබඳව පරීක්ෂණ-යක් පැවැත්වීමට යොමුකර ඇත. මේ අතර යුරෝපීය සංගමය GSP+ සහන ලබා දීමට නම් මානව හිමිකම් පිලිබඳ කොන්දේසි ගණනාවක් ක්‍රියාවට නැගීම සම්බන්ධයෙන් පොරොන්දුවක් ලබාදෙන ලෙස දන්වා සිටියහ. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වයන් සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්විණි. මීට අමතරව ඉහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහාම ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිතයින් ශ්‍රී ලංකාවට පැමිණියහ. මෙම සියලු කරුනු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වයන් වර්ධනය කිරීමට හේතු වනු ඇතැයි බලාපෙරොත්තු වෙමු.

## නීතිය ක්‍රියාවේ යෙදවීම

පැහැරගෙ යාම් සහ අනෙකුත් අන්දමේ අපරාධ පිලිබඳව වාර්තා විණි. කඩුවෙල ප්‍රදේශයෙදී සුදු වෑන් රථයකින් පැමිණි පිරිසක් පුද්ගලයින් පුද්ගලයින් 4 දෙනෙක් පැහැ-ැරගෙන ගිය බව වාර්තා විය. මෙම පැහැරගෙන යාම සිදුකිරීමට පැමිණි වෑන්රථයේ ලියාපදිංචි අංකය සටහන් කරගෙන ඇති අතර පුද්ගලයින් රැ සක් මෙම පැහැරගෙන යන් අවස්ථාව දැක තිබේ. මේ අතර අගුලාන ප්‍රදේශයේදී බැංකු කලමණාකරුවකු පැහැරගෙන ගිය අතර යාචකයින් තිදෙනෙකුගේ මළසිරුරු කොළඹ විවිධ ප්‍රදේශ වලදී හමුවී තිබේ. මේ අතර පදවිය පොලිසිය ප්‍රදේශයේ වෙළෙන්දන්ගෙන් පාරිභෝගික කටයුතු අධිකාරියේ යැයි පවසමින් මුදල් එකතු කල පුද්ගලයින් හය දෙනෙකු අත් අඩංගුවට ගෙන තිබේ.

මේ අතර පුවත්පත් වාර්තාකරුවකුට ගල්කිස්ස උසාවිය ඉදිරිපිටදී පහරදීමේ පුවතක් වාර්තා විණි. මෙම සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇති අතර පොලිසිය මේ සම්බන්දව තවමත් ක්‍රියාත්මක වී නොමැත. මේ අතර කොළඹ ප්‍රදේශයේ උපකාර පංතියකට ගොස් ආපසු නිවසට එමින් සිටි 15 හැවිරිදි දැරියක් සුදු වෑන් රථයකිනි පැමිණි කණ්ඩායමක් විසින් පැහ-ැරගෙන යෑමේ සිද්ධියක් වාර්තා විණි. මෙම පැහැරගෙන යාම කප්පම් ලබා ගැනීම සඳහා සිදුකරනු ලද බව පෙනී යයි. මෙම දැරිය නිදහස් කිරීම සඳහා රුපියල් මිලියන 20 ක් කප්පම් වශයෙන් ලබාදියයුතු බවට ඔවුන් ට දන්වා ඇති අතර පසුව එය රුපියල් මිළියන 2 දක්වා අඩුකර මෙම දැරිය වැල්ල වත්තේ දි නිදහස් කර ඇත. මෙම තත්වයන්ගෙන් පෙනී යන්නේ රටේ නීතියේ හා සාමයේ බිදවැටීමක් දක්නට ඇති බවයි. මෙවැනි සිදුවීම් සම්බන්ධ-යන් වහා අවධානය යොමුකර නිසි පියවර ගැනීමට අදාළ අධිකාරන් කටයුතු කළයුතුයි .

## ළමා අයිතිවාසිකම්

ළමුන් ගෘහසේවයේ යොදාගැනීම ශ්‍රී ලංකාවේ දිගින් දිගටම දක්නට ලැබෙන ප්‍රශ්නයකි. කාන්තා හා ළමා කාර්යාංශය හලාවත ප්‍රදේශයේ සිදුකල වැටලීමකදී අණාවරණය වූයේ හලාවත ප්‍රදේශයේ සුපිරි නිවසක 11 හැවිරිදි ගැහැණු දරුවකු මෙහෙකාර සේවයේ යොදවා සිටින බවයි. මෙම දැරිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ දුගී වතු කම්කරු පවුලක දැරියක් බව වාර්තා විණි. මෙ-වැනි ළමුන්ට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතියත් දෙමාපියන්ගේ ඇසුරත් අහිමිවී තිබේ.

මේ අන්දමට වතුකරයේ ළමුන් නිවාස වල මෙ-හෙකාර සේවය සඳහා ගෙන්වා ගැනීම සිදුවන නමුත් මේ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුවන්නේ නැත. මේ අන්දමට ළමා මෙහෙකාර සේවයේ යොදවනු ලැබූ සිද්ධීන් එකක් හෝ වාර්තා වීම මෙවැනි ළමුන් මෙහෙකාර සේවයේ යෙදවීම වැලැක්වීම සඳහා යම්තාක් දුරට



උපකාරීවේ. මෑතකදී සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කරන ලද වාර්තාවකට අනුව උතුරු නැගෙනහිර ප්‍රදේශයේ දරුවන් මන්දපෝෂණයෙන් පෙළීම 46% දක්වා වර්ධනය වී ඇත. මෙම තත්වය පසුගිය වසර කිහිපයක් පුරා පැවැති යුධමය වාතාවරණය නිසා සිදුවූයේ යැයි උපකල්පනය කල හැක.

මෙම දරුවන් සඳහා අවශ්‍ය ආහාර සැපයීමට නොපමාව කටයුතු කළ යුතුය. මෙම ප්‍රදේශවල අනාගත පුරවැසියන් වන්නේ මොවුන්ය. මෙම තත්වය දුරලීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග නොගතහොත් මෙම ප්‍රදේශවල ජනතාව නිෂ්ප-ාදන ක්‍රියාවලියට දායක කරගත නොහැකි රටට බරක් වූ පිරිසක් බවට පත්වනු ඇත. පුනරුත්ථාපන අධිකාරිය විසින් පුනරුත්ථාපනය කරනු ලැබූ පිරිමි ළමුන් 108 ක් සහ ගැහැණු ලමුන් 90 දෙනෙකු ගෙන් සමන්විත LTTE ලමා සොල්දාදුවන් වශයෙන් කටයුතු කළ කන්ඩායමක් ඔවුන්ගේ දෙමාපියන් වෙත භාරදෙන ලද අතර මෙය අගය කළ යුතුය. මෙම ළමුන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් බොහොමයක් යුධ කටයුතු සඳහා බලහත්කාරයෙන් යොදාගැනීම නිසා අහිමිවී ගියේය. මොවුන්ගේ පුනරුත්ථාපන කටයුතු කොළඹ ප්‍රධාන පෙලේ දෙමළ පාසලක දී සිදුකරනු ලදී. රජය ඔවුන්ගේ ගම් ප්‍රදේශ වලදීද ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසාදී නව ජීවිතයක් ඇරඹුම ඔවුන්ට උපකාර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## LTTE සාමාජිකයින් පුනරුත්ථාපනය කිරීම

රජය විසින් පුනරුත්ථාපනය කරන ලද LTTE සාමාජිකයින්ට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග නොගැනීමට තීරණය කිරීම ඉතා වැදගත් වේ. පුනරුත්ථාපනය කරනු ලැබූ LTTE සාමාජිකයින් 53 ක් සහභාගී වූ මහා විවාහ මංගල උත්සවයක් වවුනියාවේදී පැවැත්විණි. මෙම යුවළ් තවමත් පුනරුත්ථාපනය වෙමින් පවතින අතර මෙම ක්‍රියාමාර්ගය සම්පූර්ණ කිරීමෙන් පසුව ඔවුන් නිදහස් කරුනු ඇත. මීට අමතරව LTTE සාමාජිකයින් 10000 ක් තවමත් අත්අඩංගුවේ සිටී. මොවුන් සම්බන්ධයෙන් කළ සමීක්ෂණයකදී අණාවරණය වූයේ ඔවුන්ගේන් 10% ක් කිසිදු අධ්‍යාපනයක් ලබා නොමැති බවයි. ඔවුන්ගෙන් 80% ක්ම අටවන ශ්‍රේණිය සමත්වී නෙමැත. මොවුන්ගෙන් 4% ක් පමණක් අ: පො: ස සා: පෙ: සමත්වී ඇත. තවත් 4% ක් උසස් පෙළ සමත්වී ඇත. කිහිපදෙනෙක් විශ්වවිද්‍යාල අධ්‍යපනය අතරමගදී නතර කර ඇති අතර කිහිප දෙනෙක් උපාධිධාරීන් වෙති. මෙහිදී කණගාටුදායක කරුණක් වන්නේ ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට මූලික අධ්‍යාපනයක් ලැබී නොතිබීමයි. කිසිදු අධ්‍යාපනයක් ලබාගෙන නොමැති අය සඳහා කියවීමේ හා ලිවීමේ හැකියාව හෝ ලබාදීමට රජය යම් ක්‍රියාමාර්ගයක් ගනු ලබන්නේ නම් ඉතා වැදගත්වේ. දැනට රඳවාගෙන ඇති සැකකරුවන් අතරින් ප්‍රමාණවත් සාක්ෂි ඇති පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග රැගෙන අනෙක් පිරිස තවදුරටත් රඳවා ගැනීමෙන් තොරව ඉතා ඉක්මනින් නිදහස් කිරීමට රජය කටයුතු කරනු ඇතැයි බලාපෙරොත්තු වෙමු.

## අවතැන්වූවන්ගේ තත්වය

නැවත පදිංචි කිරීම් පිළිබඳ අමාත්‍යාංශය දක්වන අන්දමට නැවත පදිංචි කිරීම බලාපෙරොත්තුවෙන් වවුනියාවේ සහන කඳවුරු වල දැනට රැඳී සිටින්නේ 49634 ක පිරිසක් පමණි. අමාත්‍යවරයා පවසන අන්දමට මේ සියලු දෙනා මාස තුනක් ඇතුලත නැවත පදිංචි කරනු ඇත. මොහු ප්‍රකාශ කරන අන්දමට පුද්ගලයින් 226,306 ක් දැනටමත් යාපනය, මන්නාරම, වවුනියාව, කිලිනොච්චි සහ මුලතිවු දිස්ත්‍රික්ක වල නැවත පදිංචි කර ඇත. මෙම නැවත පදිංචි වන අය සඳහා දීමනාවක් ගෙවන බවට පෙරොන්දුවී ඇති නමුත් මේ අය අතුරින් බොහොමයක් දෙනා මෙම දීමනාව ලැබෙන තුරු තවමත් බලා සිටිති. මෙම නැවත පදිංචි කරන ලද ප්‍රදේශ වල ජලය හිගයක් පවතින අතර මෙම තත්වය මත ඔවුන් පීඩාවට පත්වී ඇත. වැසිකිලි නොමැති වීම නිසා ඔවුන් ගංගා ඉවුරු තම අවශ්‍යතා සඳහා යොදාගනිති. මෙම නිසා නුදුරේ දීම ඔවුන් අතර පාචනය සහ අනෙකුත් රෝග පැතිර යනු ඇත.

මෙම නිසා නැවත පදිංචිකල ජනතාවට මෙම ගම්වල පහසුවෙන් ජීවත්වීම සඳහා යටිතල පහසුකම් නැංවීම සඳහා වහාම පියවරගත යුතුවේ. එමගින් මොවුන්ට ඵලදායී අන්දමින් තමන්ගේ කටයුතු වල නිරත වීමට හැකිවනු ඇත. නැගෙනහිර පළාතේ නැවත පදිංචි කළ අතර යුද්ධය නිසා වැන්දඹුවන් බවට පත්වූ කාන්තාවන් 42000 පමණ සිටින බව වාර්තාවේ. මොවුන්ගෙන් 12000 කට

දරුවන් තිදෙනෙකුට වඩා සිටී. මෙම වැන්ද ඹුවන් වූ කාන්තාවන්ගේ අවශ්‍යතා සැපිරීමට සහ පියවරුන් අහිමි දරුවන්ගේ අවශ්‍යතා සැපිරීමට ප්‍රමුඛතාවක් ලබාදිය යුතුය. ඔවුන් රැක බලාගත යුතුය. යුද්ධය නිසා තම පවුල් වල ආදායම් උපයන්නන් අහිමිවූ පිරිස මහත් දුෂ්කරතාවලට මුහුණු දෙති. මෙම අතුරුදහන් වීම් සම්බන්ධයෙන් කිසියම් හෝ නීත්‍යානුකූල ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වෙති. මෙම තත්වය පිළිබඳව අවධානය යොමුකළ රජය සුනාමියට හසුවී අතුරුදහන් වූ පුද්ගලයන්ට මරණ සහතික නිකුත් කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයන්ට අනුකූලවූ ආකාරයට යුද්ධයේ දී අතුරුදහන් වූ පුද්ගලයන්ට ද මරණ සහතික නිකුත් කිරීම සඳහා කටයුතු කර තිබේ. මෙම ක්‍රියාමාර්ගය නිසි අයුරින් ක්‍රියාවට නැංවෙනු ඇතැයිද පුද්ගලයින් අතුරුදහන්වීම නිසා ඒ පිලිබඳව නිසි ලියැවිලි නොමැති කම නිසා අපහසුතාවලට ලක්වන පුද්ගලයින්ගේ දුෂ්කරතා මගහැරී යනු ඇතැයිද බලාපොරොත්තු වෙමු.

**පොලිස් සේවයට දෙමළ ජාතිකයින් බඳවා ගැනීම**

මෙම මාසයේදී යාපනයේ දෙමළ ජාතික තරුණ කරුණියන් 269 දෙනෙකු පොලිස් කොස්තාපල් තනතුරට පොලිස් දෙපාර්තමේන්තුව විසින් බඳවාගනු ලැබීමේ පුවත සතුටුදායක එකක්වේ. අවශ්‍ය තරම් දෙමළ ජාතික පොලිස් නිලධාරීන් නොසිටීම නිසා දෙමළ භාෂාවෙන් කරන ලබන පැමිණිලි ඔවුන්ගේ භාෂාවෙන්ම සටහන් කිරීමට නොහැකි වී තිබිණි. මෙම අලුතින් බඳවාගත් අයට ඔවුන් රාජකාරිය ඉටු කිරමේ දී මානව අයිතිවාසිකම් උල්ලංගනය නොවන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදී ඇතැයි බලාපෙරොත්තු වෙමු.

## සිවිල් සමාජය හා මාධ්‍ය අවකාශය

ශ්‍රී ලංකාවේ සිදුවන මානව හිමිකම් කඩවීම් පිළිබඳව තමන්ට උපදෙස් සැපයීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් විසින් පත්කරන ලද කමිටුව ශ්‍රී ලංකාවේ ස්වාධිනත්වයට කරන ලබන අනවශ්‍ය ඇඟිලි ගැසීමක් යනුවෙන් පුවත්පත් බොහෙ-ාමයක් තම අදහස් දක්වා තිබිණි. කෙසේ වෙතත් පුවත්පත්වල මුල් පිටුවේ සිරස්තල මේ සම්බන්ධව ඒ ඒ පුවත්පත්වල සඳහන් වූ කරුනු වලට අනුව විවිධ මුහුණුවරයන් ගත්තේය.

දි අයිලන්ඩ් පුවත්පතේ මෙම සිරස්තලය දැක්වූයේ "ඔත්තුකරුවන්ට වීසා ලබානොදේ" යනුවෙන් වන අතර ඩේලි මිරර් පුවත්පතේ සි-රස්තලය පලවූයේ "එක්සත් ජාතීන්ගේ විද්වත් මංඩලයට වීසා ලබානොදේ" යනුවෙනි. පුවත්පත් දෙකම මෙම වාර්තාකරනය සිදුකර තිබුනේ ඔවුන්ට අනන්‍ය වූ ආකාරටය. එනම් මේ පිළිබඳව මහජන මතය තමන් අපේක්ෂා කරන අකාරයට හැඩගැවෙන ලෙසය. සිංහල පුවත්පත් මීට වඩා වෙනස් මුහ-ණුවරක් ගත්තේය. කෙසේ වෙතත් මෙය ශ්‍රී ලංකාවේ ස්වාධිනත්වයට ඇඟිලි ගැසීමක් යන මතය ඔවුන් ගේ පොදු මතය විය.

රජයේ පුවත්පත වන ඩේලි නිවුස් පුවත්පත මීට වෙනස් ආකාරයකට මෙම පුවත වාර්තාකලේ "රජය තරයේ ප්‍රතික්ෂේප කරයි" යනුවෙනි. මෙහි ඊට වඩා කුඩා අකුරින් "අනවශ්‍ය ඇඟිලි ගැසීමක්" සහ "ස්වාධිනත්වයට බාධාක-රීමක්" ලෙසද සඳහන් විය. නමුත් මෙවැනි ආකාරයේ වාර්තාකරණයක වෙනත් තීරණාත්මක සාධකද තිබේ. ශ්‍රී ලංකාවේ බහුතර ජනතාවට ලංකාව පිළිබඳව පවතින ජාත්‍යන්තර මතය කෙසේද යන්න දැනගැනීමට ඇති එකම මාධ්‍යය වන්නේ පුවත්පත්ය. ජාත්‍යන්තරයේ සිදුවන සිද්ධින් අපේ රට පිළිබඳව බලපාන ආකාරය පිළිබඳව පැහැදිලි සහ ප්‍රමාණවත් අවබෝධයක් දෙන අයුරින් මෙම කිසිදු සිංහල පුවත්පතක් එම සිද්ධින් ප්‍රමාණවත් ලෙස වාර්තාකරන්නේ නැත. මෙයට හොඳම උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ වැඩිම අලෙවියක් ඇති මිලියන ගණනාවක් වූ සිංහල ජාතිකයින් විසින් කියවන ඉරිදා ලංකාදීප පුවත් පත "යුරෝපීය සංගමය ශ්‍රී ලංකාවට ලබාදෙන GSP+ සහනය තව හය මාසයක කාලයක් සඳහා දීර්ඝ කරයි" යනුවෙන් මීට ඉරිදාවල් දෙකකට පෙර පළකිරීම දැක්විය හැකියි. මෙය ඉහළ පෙලේ ආරංචි මාර්ගයකින් ලද තොරතුරක් බවද වාර්තාකරන ලදි

රාජ්‍ය මාධ්‍යයට ක්‍රියාත්මක වීමේදී යම් සීමාකාරී තත්වයන් ඇති බව වටහාගත හැකිය. නමුත් පෞද්ගලික මාධ්‍යයට මෙබඳු තත්වයත් අත්වී ඇත්දැයි යන්න තේරුම් ගැනීමට අපහසුය මේ අයද තමන්ට සැරිසැරීමට පහසු ගුවන් මගක් තෝරාගෙන ඇත්ත වශයෙන්ම පවතින සහ ඇතිවිය හැකියැයි බලාපොරොත්තු වන වායුගෝලීය කැළඹීම් සියල්ලක්ම මගහරිමින් සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රිය නියමුවෙක් වෙත තම ගමන භාරදී ඇත.

විකල්ප මාධ්‍යයන් අතරේ ප්‍රමඛත්වයගනු ලැබයේ රාවය පුවත්පත වන අතර මෙහි සැම විටම වෙනස් අන්දමේ මත දැක්වීම් වලට ඉඩ ලබාදී තිබිනි. දැනට සම්පූර්ණයෙන් තොරතුරු අණාවරණය වී නැති නමුත් අනාගතයේ ඉදිරිපත් කිරීමට නියමිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිලිබඳව නොකඩවා සජීවී අන්දමින් විවාදයට ලක්කල එකම සිංහල පුවත් පත රාවය වියහැකිය. මෙහි පලවූ වාර්තාවක ඉතා අනගි ප්‍රශ්නයක් නගා තිබිණි. සිංහල වචනයක් වන බහුභූතයා යන්න දැනට පවත්න ව්‍යයවස්ථාවේ පවතින බොහෝ අඩුපාඩු පිළිබඳව චිත්‍රයකින් නිරූපනය කිරීමට එම වාර්තාවේ යොදාගෙන තිබිණි මෙම අදහස් දැක්වීමේදී අප බහුබූතයා යන සිංහල යෙදුම වෙනුවට භූෆනරි යන්න යොදාගනිමු. රාවය කොළම ලියන්නා මෙම ව්‍යයවස්ථාව බහුබූතයකුගේ ක්‍රියාවක්ද යනුවෙන් විමසයි. අප භූතයන් ද එසේත් නැත්නම් බහුබූතයා යන වචනයෙන් අප සහ ව්‍යවස්ථාව යන දෙකම අදහස් වන්නේද? මෙම ලිපිය සැකසු තැනැත්තා පැහැදිලිව දක්වා සිටින්නේ මෙම ව්‍යවස්ථාව යටතේ බලයට පැමිණි කිසිවෙක් එය වෙනස් කිරීමට කැමැත්තක් නොදක්වන බවයි. මෙහිදී කණගාටුවට කරුණක් වන්නේ මෙම විවාදය සති අන්ත සිංහල පුවත්පතකට පමණක් සීමාවීමයි. ශ්‍රී ලංකාවේ නිතිඥ සංගමය රජය විසින් ඉදිරිපත් කිරීමට නියමිත මෙම ව්‍යවස්ථා සංශෝදනය පිළිබඳව අදහස් දැක්වීම සඳහා පළපුරුදු නීතිඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත.

එසේම ඔවුන් රජය හදිසි කටයුත්තක් ලෙස මෙම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙඒමෙන් වලකින ලෙස ඉල්ලා සිටීමටද එකගවී ඇත. කලක් තිස්සේ නින්දට වැටී සිටි ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සම්මේලනයද මෙම ව්‍යවස්ථා සංහෝධනයන් රටට හිතකර තත්වයෙන් සිදුකර ගන්නා ආකාරය පිළිබඳව සොයාබැලීමට තීරණය කර ඇත.

දොස්තර නිහාල් ජයවික්‍රම ජූනි 27 වැනිදා ඉරිදා අයිලන්ඩ් පුවත් පතේ අදහස් දක්වමින් 1972 සහ 1978 යන ව්‍යවස්ථා දෙකම බලයේ සිටි දේශපාලන බලවේග මගින් ඔවුන්ගේ පටු දේශපාලන අභිමතාර්ථයන් මහජනයා මත ක්‍රියාත්මක කිරීම සඳහා ඊට සරිලන ආකාරයෙන් සකසන ලද ඒවා වේ. ඔහු මෙහිදී ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කරන්නේ ව්‍යවස්ථාව යනු ජනතාව සහ රජය අතර වූ සමාජ සම්මුතියක් බවයි.

## ආර්ථික සංධර්භය

**අයවැය සහ වෙළදාම ආර්ථික කරුණ දැඩි අවධානයට**

ඉතාමත් ප්‍රමාද වී ඉදිරිපත් වූ අයවැයත් ශ්‍රී ලංකාවේ වෙළදාම සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශව කරුවන්වූ යුරෝපීය සංගමයත්, ඉන්දියාවත් පිලිබඳුව ඇතිවූ කරුණු මෙම මාසයේ ආර්ථික ප්‍රවෘත්ති වලදී දැඩි අවදානයට ලක්විණි

ශ්‍රී ලංකාවේ වාර්ෂික උද්ධමන අනුපාතය 4.8% දක්වා අඩුවිය. මෙම සමයේ ආහාර වල විශේෂයෙන් එළවලු ආදියේ මිළ ඉහළයාම නිසා උද්ධමනය පාලනය කිරීමට නොහැකි බවට හැගීමක් ඇති කළත් මෙය සාර්ව ආර්ථිකය සම්බකන්ධයෙන් රජයට හොඳ ආරංචියක් විය. මේ අතර විදේශ සංචිතද ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 5 කට වැඩියෙන් ප්‍රමාණවත් අන්දමින් පවතින බව රජයේ ආරංචි මාර්ග හෙළිකලේය. සාමාන්‍යයෙන් මිළ ස්ථාවරව පැවැතීමත් ප්‍රමාණාත් අයුරින් විදේශ සංචිත පැවැතීමත් නිසා යම්තාත් දුරකට බදු කපා දැමීමටත් රජයේ වියදම් වැඩි කිරීමටත් ඉඩකඩ සලසනු ලබයි .කෙසේ වෙතත් මෙම තත්වය රජයට එක් ප්‍රධාන හේතුවක් නිසා හිමිනොවීය. ඒ පසුගිය පෙබරවාරිය වන විට අයවැය පරතරය 10% තරම් ඉහළ අගයකට ලගාවී තිබුණු නිසාය.

අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් සපයනු ලබන ණය මුදල වන ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 2.6 යේ තෙවන වාර්කය වන ඩොලර් මිලියන 408 මෙරට විශාල අයවැය පරතරයක් පැවතීම හේතුකොට ගෙන පමාකරණු ලැබිණි. රජය මෙම අයවැය පරතරය වීනයෙන් ලබාගත්

ණය මගින් සෑහෙන දුරට අඩු කරගත් අතර මෙම මුදල් යොදවා විශාල පරිමාණයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතීන් වන විදුලිය ජනන ව්‍යාපෘති, හම්බන්තොට වරාය සහ ජාතික රංග නාට්‍ය මධ්‍යස්තානය ආදිය ගොඩනැගීමට යොදවනු ලැබිණි. මෙම ව්‍යාපෘති වලින් සමහරකින් ලැබුනු අන්තර්කාලීන ප්‍රතිඵල මගින් ආර්ථිකයට යම් ධනාත්මක ප්‍රතිලාභ ඇතිවිය. අනෙකුත් ව්‍යාපෘතීන් මගින් ප්‍රතිලාභ ලැබීමට යම් කලක් ගතවන අතර මේවා දැනට පවතින ආර්ථික දුෂ්කරතාවන් උග්‍රකරනු ඇත.

මෙම අයවැය පරතරය වැඩිවීම විශේෂ හේතු නිසා සිදුවූවක් නොවේ. මෙයින් කොටසක් ව්‍යුහාත්මක සාධක වන විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වැනි කරුනු උදෙසා වන අතර තවත් කොටසක් කලින් ලබාගත් සඳහා වූ ණය වාරික පොලී ආදිය නිසා ඇතිවී තිබේ. මේවා නොවැළැක්විය හැකි සාධකය. මීට බලපෑ අනෙකුත් සාධකවූයේ ආරක්ෂාව වෙනුවෙන් සහ පාරිභෝජනය සහ නිෂ්පාදනයන්ට සැපයු මූල්‍ය අනුග්‍රහයන්ය. රජය 2009 වසරේදී රුපියල් බිලියන 178 ක් වූ තම ආරක්ෂක වියදම් 2010 වසරේ දී රුපියල් බිලියන 202 දක්වා 13% කින් ඉහළ දැමීමට තීරණය කර තිබේ. තම ආරක්ෂක වියදම් මෙසේ ඉහළ දැමීමත් සමග සාමය උදාවීම නිසා ඇතිවූ ප්‍රතිලාභ සුබසාධනය, අධ්‍යාපනය, සෞඛය, අවතැන්වූවන් සඳහා සහ පසුගිය ජනවාරියේදී තම ජනාධිපතිවරණ ව්‍යාපාරයේදී මහින්ද රාජපක්ෂ විසින් පොරොන්දු වූ රුපියල් 2500 පඩි වැඩි කිරීම ලබා දීමටද අහිතකර ලෙස බලපා තිබේ.

රජය මෙම වසර අවසානයේ ඩොලර් මිලියන 500 ක බැදුම් කර අන්තර්ජාතික වෙළඳ පොලේ අලෙවි කිරීම මගින් විදේශ සංචිත උපයා ගැනීමට අපේක්ෂා කරයි. ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාව ජනවාරි මාසයේදී පරිණත තත්වයට පත්වීමට නියමිතව පැවැති ඩොලර් මිළියන 500 ක බැදුම්කර 7.4 අනුපාතිකයකට අලෙවි කිරීමට කටයුතු කළේය. මෙය එක්සත් ජනපද බැඳුම්කර වලට වඩා 5.0 වැඩි තත්වයකි. මෙමගින් අදහස් වන්නේ ශ්‍රී ලංකාව කෙන්යාව සහ උක්රේනය වැනි රටවලට සමාන අනුපාතික දක්නට ලැබෙන බවත් මෙම රටවල් වලට ලෝක වෙළඳ පොලේ බැදුම්කර විකිණීමට හැකි නමුත් මේවා ආයෝජකයින්ගේ ආකර්ෂණයට ලක්වන්නේ මිළ අඩුකර විකිණීමෙන් (වැඩි පොලී අනුපාතිකයන් යටතේ) බවත්ය.

රටේ දිගුකාලීන සහ කෙටිකාලීන ආර්ථිකය සම්බන්ධයෙන් රජය සුභවාදී මතයක් දරයි. පළමු කාර්තුව සඳහා දලජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය 7.1 % ක් විය. සංචාරක කර්මාන්තය වේගවත් ලෙස වර්ධනය වේ. 2016 වසර වන විට සංචාරකයින් මිලියන 2.5 ක් මෙරටට ගෙන්වා ගැනීමට රජය අපේක්ෂා කරයි. හෝටල් සහ අනෙකුත් අංශ නිසි අයුරින් සංවර්ධනය නොවුනු හොත් මෙම ඉලක්කයන් ලගාකර ගැනීම දුෂ්කර කටයුත්තක් වනු ඇත.

ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අත්සන් කිරීමට නියමිතව තිබූ පුලුල් ආර්තික පාර්ශවකරන ගිවිසුම (CESPA) රාජපක්ෂ ජනාධිපති තුමාගේ ඉන්දිය සංචාරයේදී අත්සන් තබනු නොලැබිණි. රජය මේ පිළබඳව වූ කෙටුම්පත ඉදිරිපත් කර නොමැත. සමහරු සඳහන් කරන ආකාරයට ඉන්දියාව සමගවූ අවුරුදු 12 පැරණි නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට එතරම් ඵලදායී නොවිනි. විශේෂයෙන්ම ඉන්දියාව වෙළඳ නොවන සම්බාධක පැනවීම මගින් ඉන්දියාව වෙත කරන ශ්‍රී ලාංකාවේ අපනයනන්ට බාධා කරන බව මොවුන් සඳහන් කළහ. නිෂ්පාදන සහතික කලට වේලාවට නිකුත් නොකිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ බලධාරීන් මේ අයගේ විවේචනයට ලක්විය. එසේම ඉන්දියානු ආයෝජකයින් විසින් බදු සහන උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාව ඉන්දියාවට අපනයනය කරන භාන්ඩ නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස යොදා නොගැනීම සම්බන්ධයෙන්ද ඔවුන්ගේ විවේචන එල්ල විය. අනෙත් අතට සීපා (CESPA) ගිවිසුම අගය කරන අය ඉතා විශාල සහ සීග්‍රයෙන් වර්ධනය වන ඉන්දියානු වෙලඳ පොළට භාණ්ඩ සැපයීම සඳහා ශ්‍රී ලංකික වෙළඳ ප්‍රජාව තවතවතු උනන්දු වනු ඇතැයිද නිර්මාණාත්මක වනු ඇතැයිද පැවසූහ. ඉන්දියානු වෙළඳ පොලට තම ගෘහ භාන්ඩ අපනයනය කර එහි ස්ථානයක් අත්කර ගැනීමට සමත්වූ දම්රෝ වැනි සමාගම් කිහිපයක් මේ අය උදාහරණයට දක්වති. මෙම වෙළඳපොළ අවස්ථා සමාන කිරීමේ දී රජයටද වගකීමක් ඇත. මෙහිදී වැදගත් වන්නේ රටේ ප්‍රමාණය නොව විකුණන භාන්ඩයේ හෝ සේවාවේ තත්වය සහ මිළයි. බෙල්ජියම, ස්විට්සරලන්තය, සිංගප්පූරුව මලයාසියාව, වැනි රටවල් සාර්ථක වී ඇත්තේ මේ ආකාරයටයි. ශ්‍රී ලංකාවට මොවුන්ගෙන් පාඩම් ඉගෙනගත හැකිය.

## මානුෂීය සහ සංවර්ධන අවකාශය

### අවතැන්වූවන්

රජයේ නිලධාරීන් පැවසුයේ නැවත පදිංචි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන තිබෙන බැවින් දැනට අවතැන් වූවන් විශාලම වශයෙන් රැඳී සිටින කඳවුරේ සිටින පුද්ගලයින් සතියකට 2000 බැගින් නැවත පදිංචි කරන බවයි. දැනට සිටින 51000 ක් වූ පිරිස වහාම නැවත ඔවුන්ගේ නිවාස වලට පිටත් කර හරිනු ඇත. විශාලතම කඳවුර වන වවුනියාවේ පිහිටි මැණික්ෆාම් කඳවුර ද ඇතුලුව වවුනියාව නගරයෙන් පිටත පිහිටා ඇති කඳවුරු තුනක් සහ යාපනයේ පියිටුවා ඇති කුඩා ප්‍රමාණයේ කඳවුරු දෙකක් මී ලග මාස 3 ඇතුලත වසා දමන ලෙස මැයි මස 28 වැනිදා ජනාධිපතිතුමා උපදෙස් ලබා දුන්නේය. නැවත පදිංචි කිරීම පිළිබඳ නව අමාත්‍යවරයා ප්‍රකාශ කරන ලද දිනය වන අගෝස්තු මාසය මෙහි අවසන් දිනය වශයෙන් සඳහන් කිරීම වඩාත් ප්‍රායෝගික වේ. ඔහු පැවසුයේ මීට ඉහතදී සඳහන් කරන ලද අප්‍රියෙල් මාසයේ දිනය එතරම් ප්‍රායෝගික නොවන බවය. මෙය වැදගත් ජාතික කටයුත්තක් ලෙස ප්‍රමුඛතාවය දී කටයුතු කරන බව ඔහු පැවසුයේය. මේ අතර මඩු ප්‍රදේශයෙන් 1985 දී පළවාහරින ලද සිංහල පවුල් ද යලි පදිංචි කිරීමට රජය කටයුතු කරනු ලබයි. මේ අතර කඳවුරුවල දීර්ඝ කාලීන වශයෙන් රැඳී සිටින පිරිසට සිදුවන මනෝ සමාජීය බලපෑම පිළිබඳව එම ප්‍රදේශයේ ප්‍රජකවරුන් තම අවධානය යොමුකරති. ඔවුන් පවසන්නේ තවදුරටත් මෙම අය කඳවුරු වල රඳවා තබා ගැනීමෙන් ඔවුන්ට සිදුවන මනෝ සමාජීය බලපෑම තවදුරටත් උග්‍ර වන බවයි.

නිවාස සහ යටිතල පහසුකම් වල පවතින හිගකම මෙම නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය වේගවත්ව සිදු කිරීමට බාධාවන් ඇති කරයි. මේ සඳහා ලැබෙන ආධාර ප්‍රමාණය අඩුවෙමින් පවතින අතර ඉන්දියාව ජපානය සහ ආසියානු සංවර්ධන බැංකුව මේ සඳහා සහයෝගය සැපයීමට ඉදිරිපත් වී සිටී. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සහනදායී නිවාස ණය සැපයීමේ නියමු ව්‍යාපෘතියක් උතුරේ කිළිනොච්චියේ නැවත පදිංචි වූවන් වෙනුවෙන් ආරම්භ කරන ලෙසට උපදෙස් ලැබී ඇත. මේ යටතේ රුපියල් 325,000 ක මුදලක් එක් නිවාසයක් සෑදීම වෙනුවෙන් ලබාදෙනු ඇත. නිවාස ගොඩ නැගීමට සුදුසු භූමිය සහ නිවාස ඉදිකර ගැනීමට කැමැත්තක් දක්වන පවුල් මාසයක කාලයක් ඇතුලත දිස්ත්‍රික් ලේකම් තුමා විසින් හදුනාගනු ලබනවා ඇත. මෙම නිවාස සාදා නිමකිරීම මාස 4 ක් ඇතුළත සිදුකරනු ඇති අතර ණය ආපසු අය කිරීම ආරම්භ වන්නේ ඔවුන් අදාළ නිවාසයේ පදිංචි වී හය මාසයක් ගතවූ පසුවය

### පෙර සටන් කරුවන්

ජුනි 13 වැනිදා වවුනියාව පොම්පෙයි මඩු විශ්වවිද්‍යාල නේවාසිකාගාරයෙහි විශාල මංගල උත්සවයත් පැවැතිනි. මෙහිදී පුනරුත්ථාපනය කරනු ලැබූ පෙර සටන් කරුවන් 53 දෙනෙක් විවාහ දිවියට ඇතුලත් වූහ. හිටපු පුනරුත්ථාපන කොමසාරිස් විසින් දක්වන ලද අදහස් වලට අනුව පුනරුත්ථාපනය වන අය විසින් කරන ලද ඉල්ලීමක් නිසා මෙම අවස්ථාව සංවිධානය කරන ලදී. දැනට පුනරුත්ථාපනය කරමින් සිටින LTTE සාමාජිකයින් පසුගිය සමයේ කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග නොගැනීමට රජය තීරණය කරන ලද බව කොමසාරිස්වරයා පැවසීය. මෙය ජාතීන් අතර ප්‍රතිසංධානය ඇතිවීම සම්බන්ධයෙන් ගත් ධනාත්මක පියවරක් ලෙස හැඳින්විය හැකිය. මේ අතර රජය මෙම පෙර සටන්කරුන් සඳහා රැකියා අවස්ථා ලබාදීමටද කටයුතු කරනු ලැබේ. මේ අනුව තරුණ තරුනියන් 269 දෙනෙකු පොලිස් කොස්තාපල් තනතුරු වලට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මංඩලය පුනරුත්ථාපනය කරන ලද හිටපු LTTE සමාජිකයින් 100 දෙනෙකුට රැකියා ලබාදීමට කැමැත්ත පල කර ඇත. මෙම අය ශ්‍රී ලංකා ගමනා ගමන මංඩලයේ යාපනයේ කොකාවිල් ඩිපෝවේ මාස තුනක රියදුරු පුහුණුවක් ලබති. පෞද්ගලික අංශයද මෙම කටුයුත්තේදී දායක වීමට ඉදිරිපත්ව සිටිති. ට්‍රයි ස්ටාර් ඇපරල් (අපනයන පෞද්ගලික )ආයතනයේ සභාපතිතුමා දැනට ආරක්ෂක හමුදාභාරයේ සිටින සාමාජිකයින් 1500 ක් සඳහා රැකියා අවස්ථා ලබාදීමට කැමැත්ත පලකර ඇත. මෙම අයට වවුනියාවේදී මේ සම්බන්ද පුහුණුව ලබාදීමට ලගදීම කටයුතු කරනු ඇත.

### සිරකරුවන්

මේ අතර පුනරුත්ථාපන සහ බන්ධනාගාර ප්‍රතිසංවිධාන පිළිබඳ ඇමති තුමා ප්‍රකාශ කලේ ඔහු වඩාත් ප්‍රමුඛත්වය ලබා දෙන කාර්යය වන්නේ සිරකරුවන්ගේ ප්‍රතිශතය 50% දක්වා අඩුකිරීමට බවය. මේ සඳහා ආරම්භක පියවරක් වශයෙන් සුලු වැරදි නිසා සිරදඩුවම් විදින අවුරුදු 60 ඉක්මවූ සිරකරු-

වන් නිදහස් කිරීමට අවශ්‍ය නිති සම්පාදන කටයුතු වල රජය නිරතවේ. මේ අය මහා මාර්ග සෑදීම, ඉදිකිරීම්, පොදු වැඩ කටයුතු සඳහා යොදාගත හැකිය. සිංහල දිනපතා පුවත් පතක පලවූ වාර්තාවක් අනුව ශ්‍රී ලංකාවේ බදු ගෙවන්නන් අපරාධකරුවන් සිරභාරයේ තැබීම සඳහා අතිවිශාල මුදලක් වැය කරති. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සිරකරුවකු සඳහා මසකට රුපියල් 10000 කට වැඩියෙන් වැය කරයි. මෙයට නිලධාරීන්ගේ වැටුප්, ආහාර සහ අනෙකුත් දෑ සඳහා වන වියදම් ඇතුළත්වේ. මෙම වාර්තාවම පෙන්වා දෙන්නේ රුපියල් 650 ක වටිනා කජු පාර්සලයක් සොරකම් කල අයෙකුට විනිශ්චයකරුවකු විසින් මාස තුනක සිරදඬුවම් නියම කළ අතර ඔහු සිරභාරයේ තැබීම වෙනුවෙන් බදුගෙවන්නන්ගේ මුදල් වලින් රුපියල් 30000 ක් රජය වැයකළ බවයි.

මේ අතර ක්ෂය රෝගය සිරකරුවන් අතර වේගයෙන් පැතිර යන බව වාර්තාවන අතර මෙම රටේ සියලුම ප්‍රදේශ වල පිහිටා ඇති බන්ධනාගාර වලින් විශේෂයෙන්ම වැලිකඩ බන්ධනාගාරයෙන් වාර්තාවේ. මෙම නිසා ක්ෂය රෝගය වැළඳුනු බවට තහවුරු කරගත් සිරකරුවන් සහ රැඳවියන් සඳහා වෙනම වාට්ටුවක් වැලිකඩ බන්ධකාගාරයේ අලුතින් පිහිටුවා ඇත.

## දුගීභාවය නිසා බලපෑමට ලක්වූවන්

පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව සමීක්ෂණයක් සෞඛ්‍ය අමාත්‍යාංශය UNICEF සහ ලෝක අහාර වැඩසටහන මගින් දකුණු පළාතේ සිදුකරන ලදී. මෙහිදී හම්බන්තොට සහ වතුකරයේ බර අඩුකම සහ වර්ධන ඌනතාවන් දක්නට ඇති බව පෙනී ගියේය. මෙහිදී අණාවරණය වූයේ රටේ පළාත් වශයෙන් ගත් කළ වෙනස් තත්වයන් දක්නට ලැබුනු බවයි. හම්බන්තොට සහ වතුකරයේ වැඩීමේ ඌනතා දක්නට ලැබුණු අතර කොළඹ ප්‍රදේශයේ ආහාර අධික වශයෙන් නාස්තිවනු අයුරු නිරීක්ෂණය කළ හැකිවිය. මෙහිදී විශේෂයෙන් කාන්තාවන් හා ළමුන් ඉලක්ක කරගෙන මන්දපෝෂණය තත්වයන් ඇතිවීමේ අවධානම වැලැක්වීම සඳහා ආහාර සහ පෝෂණ මැදිහත්වීම් සිදුකිරීමේ වැදගත්කම අවධාරණය කෙරිණි.

## වැඩිහිටියන්

වැඩිහිටියන් පිළිබඳ ලේකම් කාර්යාලයයේ සංඛ්‍යා ලේඛන වලට අනුව වයසක දෙමාපියන් ගණනාවක් නොසලකා හැරීමට ලක්වී ඇති බවත් මෙම නිසා ඔවුන් නොයෙකුත් අන්දමේ දුෂ්කරතාවන් ට මුහුණපාන බවත් පෙනී යයි. මෙම තත්වය පසුගිය අවරුදු කිහිපය තුලදී ඉහළ ගොස් ඇත. මෙම ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂිකා ජේ ක්‍රිෂ්ණමූර්ති මහත්මියට අනුව මෙම වසරේ ජනවාරි සහ මැයි මාසය ඇතුලත තමන්ගේ දරුවන් විසින් නොසලකා හරිනු ලැබූ බවටත් එමගින් ඔවුන් මුහුණදෙන අපහසුතා පිළිබඳවත් වූ චෝදනා 50 ක් පමණ එම අධිකාරියට ලැබී තිබේ. මෙය පසුගිය අවුරුදු හා සසඳද්දී සැලකියයුතු මට්ටමේ වැඩිවීමක් බව ඇය පවසයි. මේ වන විට පැමිණිලි 600 ක් පමණ ඔවුන්ට ලැබී තිබේ. මේවා අතරින් බොහොමයක් ඔවුන්ට තමන්වම නඩත්තු කිරීමට නොහැකියාව සම්බන්ධයෙන් වූ ඒවාය. මෙම තත්වය සමනය කිරීම සඳහා පියවරක් වශයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල දෙමාපියන් ට සැලකීමේ ,රැකබලා ගැනීමේ වැදගත් කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් අරඹා ඇත. මී ලග දශක දෙක තුන තුලදී වැඩිහිටියන්ගේ ප්‍රමාණය විහාල වශයෙන් ඉහල යාමේ ප්‍රවනතාවක් ඇති නිසා මෙම පිළිබඳව ද මානුෂිය සේවා සපයන ආයතන වල අවධාවය දැඩි ලෙස යොමුකළ යුතුය.

## නියගය

දිවයිනේ සියලුම ප්‍රදේශ වලට මේ වන විට වර්ෂාව ලැබීම ආරම්භ වී ඇති නමුත් අම්පාර දිස්ත්‍රික්කයේ දරුණු නියගයක ලකුණු පහළ වී ඇත. මේ වන විටත් පන්නලගම මුවන්ගල, මල්වත්ත, කොටවෙහෙර ඇතුලුගම් විශාල ප්‍රමාණයක් බීමට ගන්නා ජලය සොයාගැනීමට නොහැකිව පීඩා විඳිති. දිස්ත්‍රික් ලේකම්තුමා විසින් බීමට ජලය සැපයීමට පියවරගෙන ඇති නමුත් මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවරයන්

## පරිසරය

මෙම වසරේ නිරිත දිග මෝසම් තත්වය තුලින් ඇතිවූ දැඩි වර්ෂාපතනයක් සහ සුලං සහිත කාළගුණය තවමත් දක්නට ලැබේ. මෙහිදී ඇතිවූ ගංවතුර තත්වයන් දැන් පහව ගොස් ඇති අතර ගංගාවල ජල මට්ටම සාමාන්‍ය තත්වයට පත්වී ඇත. රත්නපුර වැනි සමහර දිස්ත්‍රික්ක වලට තවමත් දැඩි වර්ෂාවක් ලැබෙන අතර කලු ගගේ ජලමට්ටම ඉහලගිය නමුත් පැය 24 ක් ඇතුලත සාමාන්‍ය තත්වයට පත්විය. එසේ නමුත් සෑම ප්‍රදේශයකම පාහේ පවතින දැඩි සුළං සහිත තත්වය නිසා ගස් බෙහොමයක් ඇද වැටී ඇත.

මේ ආකාරයට දැඩි ගංවතුර තත්වයන් ඇති වූයේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණයේ ඇති දුර්වලතා නිසා බව සාකච්ඡාවට ලක්විණි. ඝන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ජලය බස්නා ඇළ දොළ වල් වලට දමා ඇත. මේවා ජලමාර්ග ඔස්සේ මුහුදට ගලාගිය අපද්‍රව්‍ය මුහුදේ ජල ප්‍රවාහයන් මගින් නැවතත් වෙරළට ගොඩ ගසා ඇත. මෙය අපසන්න දසුනක් මෙන්ම ලෙඩ රෝගපැතිර යාමට ද තුඩුදේ. දැනට ඉතා සීඝ්‍රයෙන් පැතිර යනු ඩෙංගු- වසංගතයද මදුරුවන් බෝවන ස්ථාන වැඩි විමට ඉහත ක්‍රියාමාර්ගයන් හේතු වීම නිසා ඇති වූ ප්‍රතිපලයක් ලෙස සැලකිය හැකිය.

මෙම ඝන අපද්‍රව්‍ය කළමණාකරණය අධික ජනගහනයක් සිටින දිස්ත්‍රික්ක වල දැවෙන ප්‍රශ්නයක් වී ඇති අතර සමහර ප්‍රාදේශිය සභා මේ සම්බන්ධයෙන් යම් කළමණාකරණයක් කිරීමට වෑයම් කරති. මේ අතර පරිසර ක්‍රියාකාරීන් ගේ අවධානයට ලක්වූ කරුණක් වූයේ CIC සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන කන්තලේ ප්‍රදේශයේ කෙසෙල් වගාවය. මේ අන්දමට වනගත ප්‍රදේශ වල (උඩවලව ජාතික උද්‍යානය ලුණුගම් වෙහෙර) කෙසෙලේ වගාව දිගින් දිගටම සිදුකරගෙන ගිය නමුත් මෙවර වගාව සඳහා යොදාගන්නා භූමි ප්‍රමාණය සහ එහි අයිතිය සම්බිධයෙන් විවාදාත්මක තත්වයක් ගොඩනැගී ඇත.

# පළාත් විශ්ලේෂණ

## නැගෙනහිර පළාත

### අම්පාර

මැතිවරණ උණුසුම පහවයාමත් සමගම අම්පාරේ ජනතාව සුපුරුදු පරිදි එදිනෙදා ඔවුන්ගේ කටයුතු වල යොමුවී සිටිති. යුද්ධයෙන් සහ නැවත පදිංචි කිරීමෙන් පසුව වගාවට යොමුවූ වී ගොවීන් මෙවර හොඳ අස්වැන්නක් ලබාගත්හ. කෙසේවෙතත් තමන්ගේ අස්වනු මිළදී ගැනීමට සුදුසු යාන්ත්‍රණයක් රජය විසින් හදුන්වා දී නොමැති බැවින් මෙහි වැඩි වාසිය අතරමැදියන්ට හිමිවී ඇත. මෙය ඔවුන්ගේ කනස්සල්ලට හේතු වී ඇත. මෙම නිසා ඔවුන් වී සඳහා නියමිත මිළක් නියම කරන ලෙසත් වී මිළිදී ගැනීමට සහ විකිණීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් සකසන ලෙටත් ඉල්ලා සිටිති

මේ හැරුණු විට දිස්ත්‍රික්කයේ ජනතාව දීර්ඝකාලීනව පැවැති යුද්ධය නිමාවීමෙන් පසුව පැමිණි සාමකාමී තත්වය පිළිබඳව මහත් සතුටට පත්වී සිටිති. ජාතීන් ඒකාබද්ධව සිදුකරනු ලබන සංස්කෘතික කටයුතු එකිනෙකා අතර මිත්‍රත්වය සහජීවනය ක්‍රමක්‍රමයෙන් ගොඩනැගීමට හේතුවී ඇත. ගමන් බිමන් සම්බන්ධයෙන් පැවැති සීමාබාධක සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති නිසා ජනතාවට එදිනෙදා කටයුතු ඉතා පහසු වී තිබේ. මේ අතර ගමනා ගමන මංඩලය දැන් අතුරු මාර්ග වලද රාත්‍රී බස් ගමන් අරඹා ඇත. අතුරු සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියාකාරකම් කැපීපෙනෙනෙ පරිදි අඩුවී ඇත. සංවර්ධන කටයුතු බාධාවකින් තොරව සිදුවේ කෙසේ වෙතත් සංවර්ධනයේ ප්‍රතිඵල සැවොම අතර සාධාරණව බෙදීයන පරිදි කටයුතු කිරීම රජයේ ඉමහත් වගකීමක් වේ. මෙමගින් ජාතීන් අතර ආතතින් පැනනැගීම වැලැක්විය හැකිය.

## මඩකලපුව

දේශපාලනික වශයෙන් ද්‍රවිඩ ජාතික සංධානය සහ අනෙකුත් දෙමළ පක්ෂ වෙනස් මතයන් දැරීම හේතුකොට ගෙන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් එක්ව වැඩකටයුතු කිරීමට බාධාවන් ඇතිවී තිබේ. මේ අතර මුස්ලිම් දේශපාලන පක්ෂ රජයේ සංවර්ධන කටයුතු සඳහා සහයෝගය දක්වති

අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් දිස්ත්‍රික් සංවරිධන කමිටුවට දේශපාලන පක්ෂ වල සහයෝගය ඇත. මෙම කමිටුව නිතිපතා රැස්වන අතර දිස්ත්‍රික්කයේ කෘෂිකර්මය, ධීවර කටයුතු ,යටිතල පහසුකම් සංවර්ධනය සහ ජීවනෝපාය මාර්ග සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර ඇත. ඊට අමතරව මෙම කමිටුව මගින් ගමනැගුම සහ ජාතික සවිය ව්‍යාපෘතීන් ද ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇති අතර මෙය කඩිනම් සංවර්ධන යෝජනා ක්‍රම යටතේ ක්‍රියාත්මක වන්නකි.

යාපනය දිස්ත්‍රික්කයේ මෙන්ම මඩකළපුව දිස්ත්‍රික්කයේද ඉඩම් බලහත්කාරයෙන් නතු කර ගැනීම සිදුවේ. මෙම කටයුතු නවත්වීමට මැදිහත් වන මෙන් ජනතාව රජයෙන් ඉල්ලා සිටිති. සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වයන් කැපී පෙනෙන ලෙස පහළ ගොස් ඇත. පුරුත්ථාපන කටයුතු මගින් තරුණයින් පළදායී කටයුතු වලට යොමු කිරීමට හැකිවී තිබෙන අතර මෙමගින් ඔවුන් වෙනත් අන්දමේ ක්‍රියාවන්ට යොමුවී සමාජයට අහිතකර තත්වයන් ඇතිවීමට තිබූ අවස්ථාවන් අවම වී තිබේ. LTTE ළමා සොල්දාදුවන් වශයෙන් කටයුතු කළ පිරිමි ළමුන් 108 දෙනෙක් සහ ගැහැණු ළමුන් 90 දෙනෙකු පුනරත්ථාපනයෙන් පසු ඔවුන්ගේ දෙමාපියන්ට භාර දෙන ලදී. මෙය මෙසේ පුනරුත්ථාපනය කරනු ලැබූ අවසාන කණ්ඩායමයි.

මෙම ළමුන්ට හොඳ අධ්‍යාපනයක් සහ රැකියා අවස්ථාවන් ලබා දෙමින් අනෙකුත් දරුවන්ට මෙන් සලකමින් වෙනසක් නොකර ඔවුන් සමාජයට අන්තර්ග්‍රහණය කරගැනීම රජය සහ පෞද්ගලික අංශය මෙන්ම සාමාන්‍ය ජනතාවගේද වගකීමක් වේ. රටට නවයුගයක් පැමිණ තිබෙන මෙම අවස්ථා වේ දේශපාලන අනෙකුත් පරස්පරතා පසෙකලා පක්ෂ එකට එක්වී රටේ යහපත වෙනුවෙන් ක්‍රියාත්මක විය යුත අතර තමන් අතර පවත්නා වෙනස් කම් අත්හැර දමා පොදු අරුමුනක් වෙනුවෙන් කටයුතු කිරීමට ජනතාව උනන්දු කළ යුතුය. මෙය සමාජය සුවපත් කිරීමේ මෙහෙයුම ආරම්භ කළයුතු මොහොත මෙන්ම ඒ සඳහා ක්‍රියාමාර්ග ගතයුතු වේලාවයි.

## ත්‍රිකුණාමලය

දිස්ත්‍රික්කයේ ජනතාව සාමයේ සතුට භුක්ති විඳිති. ජීවන තත්වයන් දිනෙන් දින ඉහළ යමින් පවතී. මහජනයාගේ ගමන් බිමන් සඳහා කිසිදු සීමාවක් පනවා නොමැත. යාපනය හා කොළඹට දිනපතා බස් ධාවනය වේ.

දේශිය සහ විදේශිය රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම නිසා තම සේවක මංඩලය සීමාකර ඇත. මෙම නිසා ප්‍රදේශයේ රැකියා විරහිතභාවය ඉහළ ගොස් ඇත. එසේම මෙහි පවත්නා අයහපත් කාළගුණයද දිස්ත්‍රික්කයේ ආර්ථිකයට සුබවාදී නොවේ. වේගයෙන් හමායන සුළං ධාරාවන් නිසා මත්ස්‍ය අස්වැන්න අඩුවී ඇත. මෙම නිසා මාලු මිල ඉහළ ගොස් ඇති අතර ධීවරයන්ගේ ආදායම අඩුවී ඇත. සිංහළ මුස්ලිම් සහ ද්‍රවිඩ ජනයාගේ සහභාගිත්වයෙන් පොසොන් පෙරහැර අතිඋත්කර්ෂවත් ලෙස පැවැත්විනි. මර්චන්ට් බැංකුවේ ශාඛාවක් ත්‍රිකුණාමළයේ විවෘතවූ අතර මෙම අවස්ථාව සනිටුහන් කිරීමට තෝරාගත් ප්‍රතිලාබීන්ට ට්‍රැක්ටර් ලබාදිමට කටයුතු කර තිබිණි.

සංචාරක කර්මාන්තයේ පිබිදීමක් පෙන්වයි. මෙම නිවාඩු සමයේ සියලුම සංචාරක හෝටල් අවන්හල් සංචාරකයනින්ගෙන් පිරී ඇත. බොහෝ අවන්හල් මෙම පැමිණෙන බොහෝ සංචාරකයින්ගේ පහසුකම් සඳහා නැවත අලුත්වැඩියා කර ඇති අතර අතිරේක කාර්යය මංඩලය බඳවා ගැනීමට කටයුතු කර ඇත. මෙම නිසා තරමක් දුරට හෝ රාජ්‍ය නොවන සංවිධානයන් කාර්යය මංඩලය අඩුකිරමේන් ඇතිවන රිනාත්මත තත්වයට යම් විසඳුමක් ලැබී ඇත.

අවුරුදු ගණනාවකට පසුව ත්‍රිකුණාමළයේ ශ්‍රී කෝනේස්වරන් ජාතික පාසලේ ප්‍රදර්ශනයක් පැවැත්වූ අතර මෙය නැරඹීමට වවුනියාව යාපනය යන දිස්ත්‍රික්ක වල සිසුහු පැමිණයහ. මෙම ප්‍රදර්ශනය නිමිත්තෙන් ප්‍රධාන මාර්ගය හරහා මාරුවීමට ඉහළින් පාළමත් ගුවන් පාලමක් ඉදිකර ඇති අතර එය සිසුන්ට ආරක්ෂාකාරීව පාර මාරුවීමට මහෝපකාරී වේ. මේ අතර ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉන්ටර් නිවුස් ආයතනයේ අනුග්‍රහය ඇතිව ත්‍රිකුණාමළයේ මාධ්‍ය නිවහන විවෘත විය. මෙහි මූලික අරමුණ නම් දිස්ත්‍රික්කවේ ජනමාධ්‍ය වේදය දියුණු කිරීමත් එහි ප්‍රමිතිය නංවාලීමත්ය.

## උතුරු පළාත

### යාපනය

A9 මාර්ගය විවෘත වීමත් සමගම රථවාහන විශාල සංඛ්‍යාවක් යාපනයට පැමිණිම පිළිබඳව යාපනයේ ජනතාවගේ මුලුහදින්ම සතුටු වන්නේ නැත. යාපනයේ වෙළඳුන් රටේ අනෙකුත් ප්‍රදේශවලින් පැමිණෙන විශේෂයෙන්ම දකුණින් පැමිණෙන වෙළඳුන් තම වෙළඳපොළ ආක්‍රමණය කිරිම ඔවුන්ගේ කනස්සල්ලට හේතුවී ඇත. ආරක්ෂක අමාත්‍යාංශයෙන් යාපනයේ සංචාරය කිරීමට පෙර අවසර ලබාගත යුතු බැවින් විදේශිය සංචාරකයිනගේ පැමිණිම සීමා වී ඇති නමුත් දේශිය සංචාරකයින්ගෙන් යාපනය පිරී පවතී

නොයෙකුත් සමාගම් ගණනාවක් යාපනයේ තම වෙළඳ කටයුතු ආරම්භ කර තිබේ. දිස්ත්‍රික්කය ආයෝජකයින් අතර ජනප්‍රිය ස්ථානයක් බවට පත්වී ඇත. හෝටල් ගණනාවක් අවන්හල් ,දේශිය බැංකු සහ විදුලි සංනිවේදන සමාගම් තම ශාඛා යාපනයේ පිහිටුවීමට කටයුතු කර ඇත. විදේශිය බැංකු ශාඛාද ළගදීම පිහිටුවීමට කටයුතු කරන බව වාර්තාවේ. බදු සහ ආයා්පන වලට සම්බන්ධ සමාගම් රාශියක් දිස්ත්‍රික්කයේ තම කටයුතු ආරම්භ කිරීමත් සමගම මෙම ක්ෂේත්‍රයට නව පණක් ලැබී ඇත. මේ අතර කොළඹ කොටස් වෙළඳපොළ ශාඛාවක් යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රථම වතාවට පිහිටු වීමත් සමගම දිස්ත්‍රික්යේ ආර්ථිකය ස්ථාවර සහ යහපත් වන බවට පැහැදිලි සලකුණු ඇති කරයි. මෑතකදී රථවාහන සඳහා වූ බද්ද අඩු කිරීමත් සමගම මෙම බදු පහසුකම් සපයන සමාගම් වලට යහපත් කාලයක් උදාවී ඇත. රථවාහන අලෙවියේ පැහැදිලි වැඩිවීමක් දක්නට ඇත. කෙසේ වෙතත් මෑත කාලීන ඇතිවූ මෙම වෙනස්කම් පිළිබඳව මෙහි ජනතාව තවමත් සැකමුසුව බලා සිටිති. ඔවුන්ගේ අදහස වන්නේ මෙම මුල්‍ය මය අංශයෙන් ඇතිවූ නව වාසිදායක තත්වය මගින් ප්‍රතිලාභ ලබන්නේ විදේශ ගත මිතුරන් නෑදෑයන් සිටින කොටස බවයි.

සමාජීය වශයෙන්ද දිස්ත්‍රිකක්ය යම් ප්‍රගතියක් ලබා ඇත. දිස්ත්‍රික්කයේ සමාජ ආර්ථික ක්ෂේත්‍රය නංවාලීමේ අරමුණු ඇතිව රජ්‍ය සහ පෞද්ගලික අංශය මගින් නොයෙකුත් වැඩමුලු, පුහුණු සම්මන්ත්‍රණ, ආදිය ක්‍රමානුකූලව පවත්වනු ලබයි. අවතැන්වූවන් සහ නැවත පදිංචිවූවන් මුහුණපාන ප්‍රධාන ප්‍රශ්න වන නැවත ඉඩම් අයිතිය ලබාගැනීම ජීවනෝපාය මාර්ග ලබාගැනීමේ දී මුහුණ දෙන පශ්න ආදියට සහය සැලසීම සඳහා ආයතන ගණනාවක් ඉදිරිපත් වී ඇත.

දිස්ත්‍රික්කයේ ජනතාව මෑතකදී පැනනැතුණු තත්වයක් වන අධිආරක්ෂක කලාප වලින් වැලි ඉවත් කිරීම සම්බන්ධයෙන් වහා මැදිහත් වන ලෙස රජයෙන් ඉල්ලා සිටිති. ඔවුන් පවසන්නේ අධි ආරක්ෂක කළාප ලෙසට නම් කර ඇති මෙම තමන්ට යත් භූමියට ඇතුල්වීමට තමන්ට අවසර නැති බවයි. දිස්ත්‍රික්කයට අමුත්තන් /සංචාරකයින් බහුල වශයෙන් පැමිණෙන නිසා හිස් බෝතල් සහ කසල විශාල ප්‍රමාණයක් පරිසරයට එකතුවේ. මේවා ඉවත් කිරීමේ නිසි ක්‍රමවේදයන් නෙමැති කම නිසා යාපනයේ ඩෙංගු රෝගය පැතිරමේ අවදානම ඉහළ ගොස් ඇත.

## මන්නාරම

රජයේ මෙහෙයවීම මත මන්නාරමේ සීඝ්‍ර සංවර්ධනයක් සිදුවේ. මන්නාරම රෝහල සඳහා මාතෘ වාට්ටුවක් මෑතකදී විවෘත කරන ලද අතර චීන රජයේ ආධාර ඇතිව ඉදිවන මන්නාරම පුනරීන් මාර්ගයේ වැඩකටයුතු වලින් 20% ක් දැනට අවසන් වී ඇත.

නැවත පදිංචිකළ අයගෙන් 90% ක ටම තවමත් රැකියා අවස්ථාවක් සොයාගැනීමට නොහැකි වී ඇත. ඔවුන් රජයේ බලධාරීන්ට දන්වා ඇත්තේ කම්කරුවන් විශාල සංඛ්‍යාවකට සේවයේ යෙදීමට අවස්ථාවක් නැති බවය. මාන්තායි දකුණු ප්‍රදේශයේ නැවත පදිංචි කළ අය හමුවීමෙන් පසු දේශපාලඥයින් විසින් කරන ලද පැමිණිලි වලින් අනතුරුව අවතැන් වූවන්ගේ ඉරණම සම්බන්ධයෙන් 215 බ්‍රිගේඩයේ කර්නල් වරයා රජයේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් සහ අවතැන් වූවන්ගේ රැස්වීමක් කැඳවීය. මෙහිදී නැවත පදිංචිවූවන් සම්බන්ධයෙන් වහාම අවධානයට ලක්විය යුතු කරුණු පිළිබඳව හැකි ඉක්මනින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙනු ලැබිණි.

මෙම රැස්වීමට පසුව අවතැන් වූවන් සඳහා සෞඛ්‍ය කඳවුරු දෙකක් පවත්වනු ලැබිණි. අවතැන්වූවන් ගෙන් බහුතරයකට මාස 6 කට සෑහෙන පරිදි වියළි ආහාර ලෝක ආහාර සංවිධානය මගින් බෙදාදෙන ලදී. නොයෙකුත් පාර්ශව විසින් දිගින් දිගටම කරුණු දැක්වීමෙන් අනතුරුව මහකන්නයේ අස්වැන්න නෙළන තෙක් තවත් අතිරේක හය මාසයක් සඳහා වියළි ආහාර ලබාදීමට ලෝක ආහාර සංවිධානය එකග විය.

මෙම ප්‍රචන්ඩ ක්‍රියා ඇරඹීමට පෙර සිංහල පවුල් 150 ක් පමණ මඩුපාර හංදියේ සාමකාමීව වාසය කළහ. මේ අය අසළ පිහිටා ඇති විහාරස්ථානයේ දායකයෝ වූහ. මේ පිරිස නැවතත් තම ගම් ප්‍රදේශයට පැමිණමින් සිටින අතර අද වන විට පවුල් 25 ක් පදංචිව සිටිති. මෙම පවුල් දැනට මෙහි පිහිටා ඇති විහාරස්ථාන පරිශ්‍රයේ පදිංචිව සිටිති. මේ අතර විඩුතලතිවු ජුම්මා මුස්ලිම් පල්ලියද වසර 25 කට පසුව පසුගිය ජූනි 25 වැනිදා ආගමික කටයුතු සඳහා විවෘත විණි.

දෙමාපියන් වැඩි දෙනෙක් දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කනස්සල්ලට පත්වී සිටිති. දැනට පවතින පහසුනම් ඉතාමත් අල්ප වේ. ඒවායේ තිබිය යුතු අවම ප්‍රමිතිය දක්නට නොමැත. 20000 කට වඩා විශ්ව විද්‍යාල සිසුනු නැවත අධ්‍යාපනය ලැබීම සඳහා කඳවුරු වලින් මුදාහැර ඇත. ඔවුන් තම අධ්‍යාපන කටයුතු නොකඩවා කරගෙන යාම සඳහා රජයෙන් සහ අනෙකුත් ආධාරදීමට කැමැති අයගෙන් මූල්‍යමය ආධාර ඉල්ලා සිටිති.

## වව්නියාව

මෙම ජූනි මාසය ආරම්භයේදී වවුනියාවේ අවතැන් වූ ජනගහණය 64000 කට අධික විය. මේ අය අතරින් බොහෝ දෙනෙක් මුලතිවු සහ උතුරේ දැඩි ආරක්ෂක කලාප වලින් පැමිණි අයවූහ. නමුත් මෙම මාසය අගභාගය වන විට මෙම සංඛ්‍යාව 48000 දක්වා පහත වැටුණු බව වවුනියා දිසාපති පැවසීය. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකක් නැවත පදිංචි කිරීම සඳහා සුදුසු අන්දමට පත්කල බැවින් පුවරසන්කුලම සහ ඕමන්තේ ඇතුලුව දිස්ත්‍රික්කයේ සමස්ථ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ගණන 6 ක් බවට පත්වේ. මේ අතර නැවත පදිංචිකල ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා ලෝක ආහාර සංවිධානයේ කාර්යාලයක් කිලිනොච්චියේ ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

අදාළ බලධාරීන් යුද්ධයේ ප්‍රතිපලයක් ලෙස සාමාජිකයින් විසිරගිය පවුල් නැවත එක්කරීමට දිගින් දිගටම උත්සාහ දැරූවත් වන්නි මෙහෙයුම් වලදී දෙමාපියන්ගෙන් වෙන්වුනු අවුරුදු 05 ට අඩු දරුවන් තවමත් ඔවුන්ගේ දෙමාපියන් ට භාරදී නොමැත. මේ අතර නීතිමය වශයෙන් විවාහ වී නොමැතිව සිටි ජෝඩු 53 ක් සහ ලගදී විවාහවූ ජෝඩු කිහිපයක්ද සහභාගී වූ මංගලොත්සවයන් වවුනියාවේ පොම්පොයිමඩු හිදී පැවැත්විනි. මෙහිදී පැවැති විවාහ ලියාපදංචියත් සමග එම අයට ඔවුන්ගේ ජීවිත යළි ගොඩ නැගීමේ දී අවශ්‍ය වන නීතිමය ලිපි ලේඛණ හිමිවනු ඇත.

පුනරුත්ථාපන කඳවුරු වෙත යොමු කරන ලද නමුත් එම කඳවුරු වෙත නොයවා තවමත් සිරභාරයේ රඳවාගෙන සිටින LTTE සැකකරුවන් පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් වවුනියාව මහේස්ත්‍රාත් වරයා සහ පොලීසිය පර්යේෂණයක් ඇරඹීය. 11000 ක් පමණ සැකකරුවන් අත්අඩංගුවේ පසුවන අතර 14000 ත් පමණ නොයෙකුත් රැඳවුම් කඳවුරු වල සිටිති. මේ අතර 1000 ක් පමණ සැකකරුවන් මේ වන විට පුනරුත්ථාපනය කිරීමෙන් පසුව නිදහස් කර ඇත.

නැවත පදිංචි කරන ලද ප්‍රදේශ වල වෙන වෙනම කරන ලද සංචාර වලින් පසුව ද්‍රවිඩ සංධානයේ මංත්‍රීවරුන් සහ ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මංත්‍රිවරු මෙම ප්‍රදේශ වල ජනතාවගේ වහාම අවධානයට යොමුකළ යුතු හදිසි අවශ්‍යතා පිළිබඳව තමන් සොයාගත් කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් ජනාධිපතිතුමාට ඉදිරිපත් කළහ. ජනතා විමක්ති පෙරමුණේ මංත්‍රිවරුන් මෙම කඳවුරු වල පවතින මන්දපෝෂණ තත්වයන් ද ළමුන් 22000 කට පමණ අධ්‍යාපනය ලැබීමට අවස්ථාවන් සහ උපකරණ සැපයීම සම්බන්ධයෙනුත් කරුණු දැක්වූහ. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වන ලද සමීක්ෂණයකට අනුව වවුනියාවේ දරුවන්ගෙන් 51% ක් මන්ද පෝෂණයෙන් පෙළෙති. මේ අතර ද්‍රවිඩ ජාතික සංධානය නැවත පදිංචි කළ 200000 ක් පමණ වූ ජනතාවට වහාම ජීවනෝපාය මාර්ග සැපයීමේ අවශ්‍යතාවය අවධාරණය කළහ.

වවුනියාවේ ජීවිතය සෙමෙන් නමුත් වඩාත් හොඳින් සාමන්‍ය තත්වයට පත්වෙමින් පවතී. කෙසේ වෙතත් අවශ්‍ය පහසුකම් සැපයීම ප්‍රමාණවත් තත්වයක නොමැත. උදාහරණයක් වශයෙන් කිලිනොච්චියේ අලුතින් විවෘතකරන ලද සතොසෙහි 99% ක්ම සිටින්නේ සිංහල කාර්යය මංඩලයක් වන අතර මෙහි පාරිභෝගිකයින්ගෙන් 100% ක්ම දෙමළ ජාතිකයෝ වෙති. මේ වන විට 180000 ක් අවතැන් වූවන් කඳවුරු වලින් නිදහස් කර ඇත. ඔවුන් ගෙන් 40% ක් පවසන්නේ ඔවුන් ජීවත් වන්නේ අතරමැදි කඳවුරු වන පල්ලි, කොවිල්, පාසල් සහ අත්හැර දමන ලද ගොඩනැගිලි බවය. මෙම අයට නැවත පදිංචි වීමට අවශ්‍ය නිවාස ආදිය සැපයිය යුතුව ඇත.

ආරක්ෂක හමුදා වෙසක් උත්සවය මහ ඉහළින් පැවැත්වූහ. මෙයට දෙමළ ව්‍යාපාරිකයින් දන්සැල් සඳහා දායකත්වය දැක්වූහ. ජූනි 18 වැනිදා රජය 30 වසරක් පුරා පැවැති යුද්ධය වෙනුවෙන් දිවිපිදූ දහස් ගණනාවක් වූ සොල්දාදුවන්ට තම බුහුමන් පිරිනමන ලදී. මාධ්‍ය වාර්තාවලට අනුව 23327 සොල්දාදුවන් මෙම සටනේදී දිවි පිදූ අතර සොල්දාදුවන් 59037 ක් තුවාල ලැබූහ. 2006 වසර අවසාන වන විට සිවිල් වැසියන්ද ඇතුලුව 80000 ක් ජනතාව මෙම යුද්ධය නිසා ජීවිතක්ෂයට පත්වූහ. මෙම යුද්ධයේ අවසන් වකවානුවේ දී එනම් 2006 ජනවාර් සිට මැයි මාසය දක්වා කාලය තුලදී ගැටුම් වලට මැදිවූ 6500 ක් සිවිල් ජනතාව මරණයට පත්වූහ.

## බස්නාහිර පළාත

### කොළඹ

මැයි මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ LTTE සංවිධානයට එරෙහිව පැවැති යුද්ධය ජයගැනීමේ පළමු සැමරුම පැවැති අයහපත් කාළගුණික තත්වය නිසා මසකින් කල් දැමූ අතර එය මෙම ජූනි 18 වැනිදා ගාලු මුවදොරහිදී පැවැත්විණි. මෙම අවස්ථාවේ ත්‍රිවිධ හමුදාව සහභාගී වූ අතිවිශාල හමුදා පෙළපාලියක් පැවැත්වුණු අතර යුධ උපකරණ දැක්මක් ද විය. මෙම අවස්ථාව සියලුම ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා වලින් සජීවීව විකාශනය කරනු ලැබිණි. මෙම උත්සවය ඇමතූ ජනාධිපතිතුමා යුද්ධය සමයේදී ශ්‍රී ලංකා රජය මානව හිමිකම් කඩකරන ලද්දේයැයි ජාත්‍යන්තර ප්‍රජාව විසින් සිදුකරන චෝදනා ප්‍රතික්ෂේප කළේය. ජනාධිපතිතුමා ප්‍රකාශ කලේ "අපගේ ආරක්ෂක හමුදාව එක් අතකින් ගිනි අවියද, අනෙක් අතින් මානව හිමිකම් පිළිබඳ ප්‍රකාශයද උතුරේ නිදහස් කළ ජනතාවට අවශ්‍ය ආහාර ද රැගෙන හද පුරවාගත් මානව දයාවද සමගින් යුධභූමියට ගිය බවයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් බැනිකී මූන් ශ්‍රී ලංකාවේ පැවැති යුද්ධයේ අවසාන සමයේදී සිදුවූවායැයි පවසන මානව හිමිකම් උල්ලංගනයවීම් පිළිබඳව සොයා බැලීම සඳහා ඔහුට උපදෙස් ලබාදීමට ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා 2009 මැයි මස ශ්‍රී ලංකාවේ සංචාරය කළ අවස්ථාවේ ජනාධිපතිවරයාත් සමග ඇති කරගන්නා ලද ඒකාබද්ද ගිවිසුමට අනුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාවට නැංවීමේ දී ඇති වගවීමට ඇති කැපවීම පිළිබඳව මෙම ත්‍රිපුද්ගල කමිටුව විසින් උපදෙස් දෙනු ඇත. මහලේකම් වරයාගේ මෙම ක්‍රියාමාර්ගය ශ්‍රී ලංකා රජයේ බලවත් විරෝධයට හේතු විය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය රජයේ විරෝධය නොතකා ශ්‍රී ලංකාවේ යුධ අපරාධ සිදුවූයේ දැයි සොයාබැලීමට මෙම කමුටුව පත්කරනු ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධායේ දේශපාලන කටයුතු පිළිබඳ ලේකම් ලියන් පැස්කෝ ශ්‍රී ලංකාවේ තෙදින සංචාරය අවසන් කරමින් පැවසුයේ මහලේකම් වරයා විසින් අන්තර්ජාතික ප්‍රමිතීන් සහ තුලනාත්මක අත්දැකීම් සම්බන්ධයෙන් ඔහුට උපදෙස් ලබාදීම සඳහා විද්වත් කමිටුවක් පත්කරනු ඇති බවය. කෙසේ වෙතත් මෙම කමිටුව පිළිබඳව රජය නොවෙනස් ප්‍රතිපත්තියක සිටින අතර ඔවුන් ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් පත්කරන ලද අතීතයෙන් පාඩම් ඉගනීමේ සහ ප්‍රතිසංධානය ඇති කිරීමේ කමිටුවේ නිර්දේශ වාර්තාව එළි දැක්වෙන තුරු බලා සිටිති.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න
http://www.humanitarian-srilanka.org/Knowledge_ Centre/ Publications.php

මානුෂිය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්ෂණික තතු විමසුම** මගින් මානුෂිය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂිය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරිම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙහෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්-දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙන්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය peace-pa1@cha.lk

**මානුෂීය සේවායතන සමූහය,**
30/81, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
දුර/ෆැක්ස්: 94-112506855/2598413